

# වතුර බූලිය

හෂාන් එදිරිසිංහ

Nation Dip: in Teaching(Primary)Merit

# වතුර බූලිය

**හෂාන් එදිරිසිංහ**

කතෘ

**මහනුවර ධර්මරාජ විද්‍යාලය**

**3 ශ්‍රේණිය ( පන්තිභාර ගුරැතුමා)**

**2025-02-08**

ISBN 978-624-208-785-6

# පිදුම

මගේ මෑණියන්ට, මගේ පියාණන්ට, මගේ සහෝදරයන්

හතර දෙනාට මෙන් ම බිරිඳට වොසඩි,යොසඳ මගේ

දුවට හා පුතාට මේ පොත පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමාන ය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# වතුර බූලිය

"නයනා, මල්ලීත් එක්ක ගිහින් වතුර බූලියක් අරන් වරෙන්.."

කුස්සිය දෙසින් අම්මාගේ ඒ හඬ අවදි වෙද්දි අක්කා කම්මැළිකමෙන් මෙන් මිදුලේ සිට, "අව්වත් සැරයි. හවසට ගේන්නම් මං" යැයි අඬන්නක් මෙන් කීවේ ඇගේ අකමැත්ත ද ප්‍රදර්ශනය කරමිනි. එම වචන කිහිපයෙන් අම්මාගේ සිතේ තරහක් ඇති වී, අක්කාට බැන වැදුනේ යකෙක් ආවේස වූ පරිද්දෙනි.

" ඇයි , උඹට බැරි ? මල්ලීත් එක්ක ගිහින් ගෙනෙන් ඉක්මනට.. මෙතන නාඩගම් නට නටා ඉන්නේ නැතුව .." සෙල්ලම් කරමින් සිටි අක්කා අම්මාගේ අණට බැගෑපත්ව , ගේ තුළට ගොස් ටික වේලාවකට පසුව එළියට ආවේ දෑතින් බූලිය ද රැගෙන උදාසීන ගතියෙනි.

පවුලේ සියලු බර තම හිසට ගත් අම්මා හට විරුද්ධ වීමට තරම් ශක්තියක් අක්කාට නොවීය. පුළුවන් තරමින් අම්මා සමග එළවළු කොරටුවේ වැඩට උදවු කිරීමට අක්කා ද ,මා ද අමතක කරේ නැත. ඒ අපි දෙදෙනා පුංචි ම අවධියේ තාත්තා අපගෙන් සමුගත්තේ කොරටුවේ අස්වනු නෙළන කාලයේ ය . එදා සිට අම්මාට තනියම එළවළු කොරටුවේ වැඩ කළ නොහැකි නිසා , හැකි සෑම විට ම අම්මාගේ අත් උදව්වට අක්කා හෝ මම එහි ගියෙමු.

වතුර ගෙන ඒමට ළිඳක යෑමට ඇත්තේ බොරලු අතුරන ලද පාරකින් දුර ගෙවා දැමීමෙනි. අක්කා සමග බයිසිකලයට නැග ගත් මා හනි හනිකට බයිසිකලය පැදවූයේ , උඩිනුත් ගින්දර යටිනුත් ගින්දර මැද තැම්බෙන ආප්පයක් ආකාරයට ය.



"මල්ලි, හිමීට යමන් බං "

අක්කා කිහිප වරක් මට එලෙස කිව්ව ද එය කනකොට නොගෙන මා බයිසිකලය පැදවූයේ යකුන් ගස් නගින දහවලේ පාරේ යාම සතෙකුට වුව ද අසීරු නිසාවෙනි. අපේ විඩාව නිවාගන්න එකම සහනයකට තිබුණේ පාර අයිනේ දිගට තිබුණු ඇළ පමණි. අප ළිඳ

ළඟට සේන්දු වන විට දහඩියෙන් මා වෙලාගෙන තිබුණේ.

හනි හනිකට බයිසිකලයෙන් බැසගත් මා අක්කා ළිඳට යන විට ඇළ දෙසට ගොස් මුහුණු කට සෝදා ගත්තේ ය. හුඟ වේලාවකට පසු අක්කාගේ හඬ අවදි වුවා ය.

" මල්ලී , බූලිය අල්ලගන්න වරෙන් බන් .."

"මේ එනවා අක්කේ.. ඉක්මනට ගෙදර යමු.."

අක්කා සිටින දෙසට ගොස් වතුර බූලිය අක්කා සමග අල්ලා ඇළට දමා ගත්තේ අසීරුවෙනි.

" මල්ලී උඹ පරිස්සමෙන් බයිසිකලෙන් වරෙන්.." යැයි කියමින් ඇය බැස ගත්තේ පය බිම නොවදින ගැඹුරින් යුත් ඇළට ය. වතුර බූලියේ වතුර මට්ටම අඩු කර තිබුණ නිසා බූලිය පා කර පීනමින් අක්කාට යාමට පහසු විය . අක්කා පීනන වේගයට සමාන වේගයෙන් බයිසිකලේ පැදගෙන පාර දිගේ මම ආවෙමි .




එසේ අපට වැඩිදුරක් ඒමට නොහැකි විය. ජීප්රියක් මා ඉදිරියේ නැවැත්වූයෙන් අක්කා ද මා ද භීතියට පත් විය.ජීප් රියෙන් බැසගත්තේ අව්වට පළදින අව් කණ්ණාඩි දෙකක් දමා ගත් පොලිස් නිලධාරියෙකි. මා ඉදිරියට පැමිණි ඔහු,

"කොහෙද යන්නේ ?" යනුවෙන් විමසුවෙන් අප තුළ තිබුණු බිය තවත් වැඩි කරලී ය. අක්කා ඇළ දෙස සිට

"වතුර ගේන්න ගියා."

යනුවෙන් කියූ විට පොලිස් නිලධාරියා ,

“කෝ, ගෙනාපු වතුර ? ” යැයි ඇසූ විට , ඇළ තුළ සිටි අක්කා,

“ වතුර මෙන්න " යැයි දුන් පිළිතුරෙන් පොලිස් නිලධාරියා කෝපයට පත්විය . ඔහු සිතුවේ අක්කා පෙන්නන්නේ ඇළෙහි වතුර වන බවයි.

“ විහිළු කරන්න එනව ද මට..?”

යැයි දැඩි ස්වරයෙන් කියා මගේ බයිසිකලේ හැඩලය දෙසින් අල්ලා ගත්තේ ය. එවිට අක්කා කළබලයට පත්ව,

“මල්ලීට ගහන්න එපා . මේ තියෙන්නේ වතුර බූලිය .."කියා කෑගසන්නට විය.

පසුව අක්කා ඇළෙන් ගොඩ වී බූලිය රැගෙන පාරට ආවේ පොලිස් නිලධාරියාගේ ආධාරයෙනි. පොලිස් නිලධාරියා බූලියට අතින් තට්ටු කර,

“ මේකෙ මූඩිය අරිනවා බලන්න."

යැයි අක්කා දෙසට හැරී කීවේ ය. අක්කා සෙමින් සෙමින්

මූඩිය විවෘත කළේ ය. ඉන්පසු පොලිස් නිලධාරියා,

“ බලමු මේ වතුර ද? නැත්තම් කසිප්පු ද කියලා.."

කලබලයට පත්ව සිටි අක්කා,

“කසිප්පු නෙවෙයි මහත්තයෝ.. අපිට යන්න දෙන්න.."

යැයි කියූ විට පොලිස් නිලධාරියාගේ සැකය තවත් වැඩි වූ

බව හැඟුණි.

“ කසිප්පු තියෙන්නේ කොහේද..? ඒවා ගෙනියන්නේ

කොයි වෙලාවට ද ?,

“අපි.. දන්නෑ.. මහත්තයෝ .."

“දන්නෑ.. දැනගන්න විදිය මම දන්නවා. "

පොලිස් නිලධාරියා අක්කා ළඟට ගොස් මුහුණ දෙස බලා

දැඩි ස්වරෙන් කතා කරද්දි, බීරාන්ත වී ගියා මෙන් අක්කා

ගල් ගැසුණි. එයින් පසු ඇයගෙන් ඇසූ සෑම දෙයකට ම පිළිතුරු දුන්නේ ගොත ගසමිනි.

මීට දෙන කිහිපයකට පෙර ඇළ දිගේ හොර කසිප්පු රැගෙන ගිය අමරපාල මාමායි , ධනපාල මාමායි පොලිසියේ මහත්තුරුන්ට අසු වුණු බව ක්ෂණයකින් මගේ හිතට නැගුණි.

" දුවේ , ගෙදර ගිහින් ගෙදර අයට කියන්න"මල්ලී එක්කන් යන්න හෙට උදේ නවය වෙනකොට පොලිසියට එන්න කියලා. " එය කියා මගේ අතින් අල්ලා ගත් පොලිස් නිලධාරියා "

"යමු ,ජීප් එකට නගිමු."

කියමින් මා කැදවාගෙන ජීප් රිය දෙසට ගොස් එයට නංවා ගත්තේ ය. අක්කාගේ හැඬුම් හඬ අතුරෙන් කිසිවකු නැති පාර , මාර බියකින් වැසී ගත්තාක් මෙන් දිස් විය.




ජීප් රියේ නැගුණු මා පොලිසිය වෙත ඇදී ගියේ, අක්කා සමග මා බයිසිකලෙන් පැමිණි ගුරු පාර පසු කරගෙන ය. ටික දුරක් යන විට ටොමියා බුරන ශබ්දය අතරින් අපේ ගෙදර පසුවන විට මගේ හිත බියෙන් තැති ගත්හ. කෙමෙන් මහත් භයංකාර ගතියක් ඇති කරමින් පොලිස් ස්ථානය වෙත පැමිණියේ හතර වටෙන් වට වූ කුඹුරු අතරින් ය.

" මගේ අම්මවත් හිටියනම් මගේ ළඟ" යැයි මට කිහිප වරක්ම සිතට දැනුණි. ජීප් රිය නවතනවාත් සමග තවත් පොලිස් නිලධාරීන් දෙදෙනකු පැමිණ මගේ උරහිසෙන් එක් නිලධාරියෙකුත් , අනෙක් පොලිස් නිලධාරීයා මගේ අතින් අල්ලාගෙන පොලිසිය තුළට රැගෙන ගියේ, මිනීමැරුමක් , මංකොල්ලයක් කළ තැනැත්තකු රැගෙන යන පරිද්දෙනි. මා රැගෙන ගොස් සිර මැදිරියක් ඉදිරියෙන් හිඳුවා, එක් පොලිස් නිලධාරීයෙකු අසළ කාමරයකට ගොස් යතුරු කැරැල්ලක් ගෙන සිර මැදිරියේ දොර ගුලු ඇරියේ ය. මා අල්ලාගෙන සිටි පොලිස් නිලධාරීයා මාගේ පිට දෙසින් අල්ලා,

" හ්ං ඇතුළට යනවා."

" අනේ මහත්තයෝ මම මෙහෙම ඉන්නම්. මට බෑ මේක ඇතුළට යන්න "

"යනවා යනවා වද දෙන්නෙ නැතුව"

කන්දක ඉහළ සිට පහළට ගලක් ඇද වැටෙන්නාක් මෙන් මගේ සිත ද සසල විය.

විනාඩි ,හෝරා ගත වෙමින් රාත්‍රිය එළැඹිණි. නිදාගැනීමට ඇත්තේ කුඩා බංකුවකි. විඩාවට පත්ව සිටි මා එහි හාන්සි වූ විට අම්මා ,අක්කා සිහියට නැගුණේ දෑසට කඳුළු බිඳු ද එක් කරමිනි.
පසු දින අම්මා සමග අක්කා මා බැලීමට දුර ගෙවා ආවේ දෙදෙනාගේ ම දෑස් ජම්බු ගෙඩි මෙන් ඉදිම්මවාගෙන ය.
අක්කා මා සිටි සිරිමැදිරිය අසළ නැවතුණු අතර අම්මා දෙඅත් එක්කර වැදගෙන පොලිස් නිලධාරියෙකු පසුපස දිව යනවා මා දුටුවේ ඉවසාගත නොහැකි මව් සෙනෙහස ඇගේ හද පුරා පැතිර ඇති බව මට පසක් කරමිනි.

"මල්ලී, කොහොමද ඔයාට? අපි නැතුව පාළුව දැනුණේ

නැද්ද? මමයි , අම්මයි ඊයේ ඉඳලා අද එළිවෙනකන්

ඇහැරගෙන හිටියේ. ඔයා දැන් ගෙදර ඒවි

"දැන් ගෙදර ඒවි කියලා.."

" මමත් එහෙමයි අක්කෙ , නින්ද ගියේ නෑ. ගෙදරමයි

මතක් උනේ. "

"අඬන්න එපා මල්ලී, අපි දැන් ඔයා ළඟ ඉන්නවානේ.."

මා සනසන්නට අක්කා කුමක් කීවත් මගේ සිත

තිබුණේ අම්මා ළඟ ය. වෙලාව ක්‍රමයෙන් ගෙවුණි. ඈත

කාමරයක අම්මා, පොලිස් නිලධාරියෙකු සමග කතාබහ

කරන ආකාරය මට දිස්විය . අනතුරුව පොලිස්

නිලධරියෙකු අප වෙත පැමිණ ,

" ඕ.අයි.සී . මහත්තයා ඔය දුවට එන්න කිව්වා."

"ඒ මොකටද මහත්තයෝ?"

" ඇවිල්ලා බලන්න. මොකටද කියලා..?"

" අක්කේ , ඔයා ගිහින් බලන්න.."

මගේ ඉල්ලීමෙන් පසුව අක්කා එම පොලිස් නිලධාරියා  සමග ඕ.අයි.සී. මහත්තයා සිටින කාමරය වෙත ගියේ ය .

"මේ ගමේ කසිප්පු හදන එක , විකුණන එක සම්පූර්ණයෙන් ඉක්මනින් නවත්තනවා.  ඉදිරියට ඔයාලාගේ  උදවු මට ඕන වෙනවා ... හොඳ ද පුතා... "යැයි කියමින් ඕ.අයි.සී. මහත්තයා මගේ පිටට තට්ටුකර ඔළුව ද අත ගා අම්මා දෙස හැරී ,

" ගෙදර යන්න සල්ලි තියෙනව ද අම්මේ ? "

යනුවෙන් විමසද්දී අපේ අප නෙත්වලින් සතුටු කඳුළු ඇද හැලුනේ මන්දැයි මම නොදනිමි ...



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි ය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-785-6